# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2125/69 - 2019 ජුනි මස 01 වැනි සෙනසුරාදා - 2019.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 ජුනි මස 01 වන දිනයෙන් ආරම්භ වී 2020 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති සේවා සැපයීම මත, එම උපලේඛනයේ II වන තීරුවේ ඊට අනුරූපීව සඳහන් කර ඇති නිශ්චිත අනුප්‍රමාණය අනුව එකතු කළ අගය මත බදු ගෙවිය යුතු බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත්කරමි.

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවන ලද 2019 මැයි 21 දිනැති අංක 2124/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියමය 2019 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| අනු අංකය | I<br>විස්තරය | II<br>බදු අනුප්‍රමාණය |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සේවා සැපයුම | 7% |
| 2. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සංචාරක නියෝජිතයින් විසින් රට තුලට එන සංචාර හා සම්බන්ධ සේවා සැපයුම | 7% |

06 - 618

1A - PG 4548 — 542 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.